# ගෝමරන්කඩවල ප්‍රාදේශීය සභාව

## ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 පෙබරවාරි 11 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 ජනවාරි 07 දින ද විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂයට අදාල විගණකාධිපතවරයාගේ වාර්තාව 2014 ජුනි 30 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව ගෝමරන්කඩවල ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට ගෝමරන්කඩවල ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරනනා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී භාවිතා කරනු ලැබූ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

---

**(ආ)** මෙහෙයුම් කටයුතු සහ ආදායම් ඉපයීම සඳහා භාවිතා කර තිබූ එකතුව රු. 7,487,441 ක ස්ථාවර වත්කම් සඳහා ක්ෂය වෙන්කර නොතිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ වියදම සභාවේ තත්‍ය වියදම නිරූපණය කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**

---

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය **කරනු ලැබේ.**

**(අ)** උතුරු නැගෙනහිර පළාත් සේවා ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ (NELSIP) ගිණුම් සභාවේ ගිණුම් සමග ඒකාබද්ධ කිරීමට කටයුතු කර නොතිබීමෙන් ව්‍යාපෘතියේ මුදල් පොතේ ශේෂය රු.5,828,289 ක් ද, ගොඩනැගිලි පිරිවැය රු.4,367,649 ක් ද, ගෙවිය යුතු රැඳවුම් මුදල් රු. 1,722,576 ක් ද , ලැබි යුතු අත්තිකාරම් රු. 1,605,000 ක් ද ගිණුම් වලින් අත්හැර තිබුණි.

**(ආ)** මුදල් පොත් අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ බැංකු ශේෂය රු.647,979 ක් වුවද , එය රු.696,244 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් බැංකු ශේෂය රු. 48,265 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

**(ඇ)** සමාලෝචිත වර්ෂය අවසානයේ අත ඉතිරි මුදල් ශේෂය රු. 43,367 ක් ගිණුම්ගත කර නොතිබුණි.

**(ඈ)** 2012 මාර්තු 31 දින දක්වා ලද රු. 1,291,721 ක් වූ ස්ථාවර තැන්පතු පොලී සමාලෝචිත වර්ෂයේ දී ජ්නල සටහනක් මගින් වැරදි ලෙස ගිණුම්ගත කිරීමෙන් ආදායම් ණයගැතියන් සහ සමුච්චිත අරමුදල එම වටිනාකමෙන් මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි.

**(ඉ)** සමාලෝචිත වර්ෂයට අදාළ රු.98,200 ක් පමණ වූ ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී ගිණුම් ගත කර නොතිබුණි.

**(ඊ)** මාසික ඒකාබද්ධ වැය සාරාංශය අනුව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම රු. 4,636,088 ක් වූවද , එය රු. 5,031,974 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් වර්ෂයේ පුනරාවර්තන වියදම රු. 395,886 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

**(උ)** මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය අනුව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ආදායම රු. 7,492,076 ක් වූවද , එය රු. 5,165,953 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් වර්ෂයේ පුනරාවර්තන ආදායම රු. 2,326,123 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

**1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම**

---

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා රු.3,437,861 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.3.4 නීති,රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති,රීති , රෙගුලාසි සහ විධි විධානවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1989 අප්‍රේල් 17 දිනැති අංක 554/ 5 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 59 වැනි රීතිය. | සභා බල ප්‍රදේශයට අයත් ව්‍යාපාර ආයතන පළිබඳ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |
| (ආ) | රාජ්‍ය පරිපාලන පලාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | සභාව සතු වාහන 04 සම්බන්ධයෙන් මාස 06 කට වරක් ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.132,940 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 79,374 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

සමාලෝචිත වර්ෂයේ තත්‍ය වියදම සහ අයවැයගත වියදම සියයට 2 සිට සියයට 76 දක්වා වූ පරාසයක විචලනයක් පැවතුණි. ඒ අනුව වාර්ෂික අයවැය විධිමත් මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදගෙන නොතිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1. ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම සහ හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | - | 5 | - |
| (ii) | බදු කුලී | 1,323 | 525 | 1,062 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 72 | 52 | 26 |
| (iv) | වෙනත් ආදායම් | 5,585 | 4,584 | 755 |

### 2.3.2 ආදායම් සම්බන්ධව අතුරු ව්‍යවස්ථා සම්පාදනය

සභාව විසින් 2013 අගෝස්තු 15 දින බේකරි, කෝණ්ඩා කැපීම, රූපලාවන්‍යාගාර විධිමත් කිරීම වැනි ආදායම් සම්බින්ධ අතුරු ව්‍යවස්ථා සහා අනුමැතිය ලබා පලාත් පාලන කොමසාරිස් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇති නමුත් මේ දක්වා එම ව්‍යවස්ථා නීතිගත කර නොතිබුණි. ඒ හේතුවෙන් අදාල මූලාශයන්ගෙන් ආදායම් අයකර ගැනීමේ අවස්ථා සභාවට අහිමි වී තිබුණි.

### 2.3.3 කඩකුලී

2012 වර්ෂයට අදාළව ලැබිය යුතු කඩ කුලී රු. 25,250 ක් 2014 මාර්තු 31 දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.3.4 උසාවි දඩ

නැගෙනහිර පලාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2012 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වශයෙන් ලැබිය යුතු මුදල් හදුනා ගැනීමට සහ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 කොන්ත්‍රාත් පරිපාලනය

### (අ) ගල්කඩවල වෙලමැද පාර කොන්ක්‍රීට් යෙදීමේ ව්‍යාපෘතිය

ගල්කඩවල වෙලමැද පාර මීටර් 1000 ක දිගකින් මීටර් 3 ක පළලකින් සහ අගල් 6 ක ඝනකමකින් යුක්තව කොන්ක්‍රීට් යොදා ඉදිකිරීම සඳහා රු 8,025,000 ක මුදලකට කොන්ත්‍රාත්කරු සමග 2012 අප්‍රේල් 4 දින ගිවිසුම් අත්සන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කොන්ක්‍රීට් පාර ඉදිකිරීමට අදාලව සක්‍යතා අධ්‍යනයක් සිදු නොකිරීම හේතුවෙන් පාර සම්පූර්ණයෙන් සංවර්ධනය කළ යුතු ආකාරය පිළිබඳව නිවැරදිව ඇස්තමේන්තු සකස් කිරීමට නොහැකි වී තිබුණි.

(ii) පැරණි බෝක්කු 05 සංවර්ධනය කිරීමට කටයුතු නොකිරීමෙන් එම බෝක්කු තිබූ ස්ථාන සඳහා එකතුව වර්ග මීටර් 135 ක ප්‍රමාණයකට කොන්ක්‍රීට් යොදා නොතිබුණි. පැරණි බෝක්කු 05 ඉදිනොකර පාර කොන්ක්‍රීට් කර තිබීම හේතුවෙන් ජලය බැස යාමේ අවහිරතා ඇතිවී තිබුණි. එම නිසා පාරේ දිගුකාලීන පැවැත්මට අහිතකර බලපෑම් ඇතිවිය හැකි බව 2014 මාර්තු 19 දින කරන ලද භෞතික පරීක්ෂණයේදී නිරීක්ෂණය විය.

### (ආ) පානීය ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

සමාලෝචිත වර්ෂය තුළදී පානීය පොදු ළිං ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ රු. 226,464 ක වියදමකින් ගල්කඩවල පානීය පොදු ළිඳ ඉදිකර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පානීය පොදු ළිඳ ඉදිකිරීමට අදාළව පිඹුරු පත (Drawing) පිළියෙල නොකිරීම හේතුවෙන් ළිඳෙහි ගැඹුර, විශ්කම්භය, බැම්මෙහි පළල ඇතුළු ළිඳ ඉදිකළ යුතු ආකාරය විගණනයේ දී නිවැරදිව හඳුනා ගැනීමට නොහැකි විය.

(ii) මෙම ළිඳ පොදු ළිඳක් ලෙස භාවිතා කිරීමට කැමැත්ත ලබා ගැනීමකින් තොරව **පුද්ගලික ඉඩමක** ඉදිකර තිබුණු අතර එය පොදු ළිඳක් ලෙස භාවිතා කිරීමට හැකි පරිදි වෙන්කර නොතිබුණි.

---

2.5 **පාරිසරික ගැටළු**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** ගෝමරන්කඩවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ග්‍රාම නිලධාරි වසම් 10 ට අදාලව ජනතාව බීමට සුදුසු පානීය ජලය නොමැති වීමෙන් දැඩි අපහසුතාවයකට පත් වී ඇති අතර වකුගඩු රෝගය ද සීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙමින් පවතින බව ග්‍රාමනිලධාරි වාර්තා තුළින් අනාවරණය විය. සම්පූර්ණ ග්‍රාම නිලධාරි වසම් 10 ආවරණය වන පරිද පානීය ජලය සැපයීමේ කෙටිකාලීන හා දිගකාලීන සැලසුම් සකස් කිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

**(ආ)** දැනට වාර්තා වී ඇති වකුගඩු රෝගීන් පිළිබඳ දත්ත රැස්කිරීමට, ජනතාව මෙම රෝගය පිළිබඳව දැනුවත් කිරීමට සහ මෙම තත්වය පිළිබඳ අදාල වගකිව යුතු ආයතන වෙත දැනවීමට සභාව කටයුතු කර නොතිබුණි.

**2.6** **මානව සම්පත් කළමනාකරණය**

**අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2012 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සෙවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| විධායක මට්ටම | 01 | - | 01 |
| ද්විතික මට්ටම | 15 | 05 | 10 |
| තෘතීය මට්ටම | 16 | 06 | 10 |
| **එකතුව** | 32 | 11 | 21 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** වැඩ බැලීමේ පදනම මත පත් කරන ලද නිලධාරියෙකු මගින් සභාවේ ලේකම් තනතුරෙහි රාජකාරි ආවරණය කරන අතර අවුරුදු 15 සිට ලේකම්වරයෙකු පත්කිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

**(ආ)** පුරප්පාඩු සේවක සංඛ්‍යාව තුළ ඇතුළත්ව තිබූ පුස්තකාලයාධිපති තනතුරු 02 ක් සහ සංවර්ධන සහකාර තනතුරු 05 ක් වර්ෂ 03 කට වැඩි කාලයක සිට පුරප්පාඩුව තිබී ඇතත් එම නිලධාරීන් බඳවා ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

3. **පද්ධති හා පාලන**

**-----------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

**(අ)** ගිණුම්කරණය

**(ආ)** අයවැය පාලනය

**(ඇ)** ආදායම් පරිපාලනය

**(ඈ)** වත්කම් කළමනාකරනය

**(ඉ)** කොන්ත්‍රාත් පරිපාලනය

**(ඊ)** මානව සම්පත් කළමනාකරණය